සන්නස SANNASA

# අර්ය අරණ ධර්ම දේශනා 2

## බුද්ධ ධර්මය හා බුද්ධාගම 2

### පසුගිය කලාපය හා බැඳෙයි

### පළවෙනි කරුණ
### (කාලාම සූත්‍රය ඇසුරෙන්)
### පිළිපැදිය යුතු අස්සාය හතර

පළවෙනිම මට්ටම තමයි ම බුදුපියාණන් වහන්සේ මේ කාලාම සූත්‍රයේ දේශනා කරපු කරුණු ටික. දැන් කාලමයන්ට දේශනා කරපු කරුණු ටික අපි බොහොම සුපරික්ෂාකාරීව බැලුවොත්, ඒ කාලාමයෝ හිටපු කේෂපුත්ත ගම බොහොම මාර්ග සමීපයේ තිබ්ච්ච ගමක්. ඒ නිසා ඒ මාර්ග යේ යන එන විවිධාකාර පුද්ගලයෝ කේෂපුත්ත ගමට ආවා. ඉතින් මේ කේශපුත්ත ගමට ඒ නිසාම විවිධාකාර ශාස්තෘවරුන්, විවිධාකාරයේ දේශකයන්, විවිධ මතධාරීන් ආපු තැනක්. ඒ නිසාම මේ ගමේ මිනිස්සු එක එක් කෙනාගෙ දේශනා අහලා තිබුණා. ඒ දේශනා ඇසීමට මුල් කාලයේ උනන්දුවක් දැක්වූවා. මේවායින් අපිට යම්කිසි දෙයක් අවබෝධ කරගන්න පුළුවන් කියලා. නමුත් ඒ දේශනා කරන්න එන අය කියන කථාවල් නිසා එන්න එන්නම මේගොල්ලො න්ට මේ දේශනවලට තියෙන උනන්දුව අඩුවෙලා ගියා. ඒකට හේතුවක් තියෙනවා. මොකක්ද ඒ හේතුව ?

මේ එන අය, දේශකයෝ හෝ වේවා, ශාස්තෘවරු හෝ වේවා, විශේෂඥයෝ හෝ වේවා කවුරු හරි කෙනෙක් ඇවිල්ලා කියන්නෙ, “මෙන්න මේක තමයි නිවැරදි මතය. අනෙක් අය කියපු ඒවා ඔක්කොම සාවද්‍ය මත බොරු කතා. ඒවා ගනන් ගන්න එපා. මේක තමයි හරි. මේක පිළිගන්න” කියලා. එතකොට ඔය හැමෝම ඇවිල්ලා ඔය කථාව කියනවා. එතකොට කේශපුත්ත වැසියන්ට මොකක්ද හරි ? මොකක්ද වැරදි ? කියලා හිතාගන්න බැහැ. (අපි දැන් අද පත්වෙලා ඉන්න තත්ත්වය වගෙයි. එක්කෙනක් එක කතන්දරයක් කියනවා. තව එක්කෙනෙක් තව එකක් කියනවා. “මගෙ එක හරියි කියනවා. එයාගෙ එක වැරදියි කියනවා. ඒක නෙමෙයි හරි මේක හරියි” කියනවා. විසඳගන්න බැරි අවුලක පැටලෙනවා) අන්න ඒ වගේ කේශපුත්ත වැසියෝ ඔහොම ඉන්නකොට කල්පනා කෙරුවා. “ පටලැවිල්ලක්. ඔළුව අවුල් වෙන වැඩක්. එයිට වැඩිය හොඳයි මේ බණ අහන්නෙ නැතුව ඉන්නවා නම්” කියලා.

ඔන්න ඔහොම ඉන්න කොට බුදුපියාණන් වහන්සේ මේ කේශපුත්ත ගමට වැඩියා. වැඩියහම බුදුපියාණන් වහන්සේ පිළිබඳ කීර්ති රාවය අහලා මේ කේශපුත්ත වැසි කාලාමයෝ “මේ බුදුපියාණන් වහන්සේ රජ පවුලක කෙනෙක්. මෙයා රාජ්‍යය අත හැරලා පැවිද්දට බැහැලා. අරහත් ඵලය සාක්ෂාත් කරගෙන බුද්ධත්වයට පත්වෙලා ඉන්නවයි කියලා මහා කීර්ති ඝෝෂාවක් තියෙනවා. ඒ නිසා උන්වහන්සේ දැක බලා



ගන්න ඕන” කියන අදහසින් බුදුපියාණන් වහන්සේ ඉන්න තැනට ගියා මේ කේශපුත්ත වැසියෝ බුදුපියාණන් වහන්සේ හමු වුණාට පස්සේ. බුදුපියාණන් වහන්සේ ඉතින් බොහොම සුහදව සතුටු සාමීචි කතා කරලා හිටියා. ඔහොම ඉන්නකොට දැන් කේශපුත්ත වැසියෝ කල්පනා කරනවා බුදුපියාණන් වහන්සේ හමු වුණාට පස්සේ, බුදුපියාණන් වහන්සේ ඉතින් බොහොම සුහදව සතුටු සාමීචි කථා කරලා හිටියා. ඔහොම ඉන්නකොට දැන් කේශපුත්ත වැසියෝ කල්පනා කරනවා “මේ උත්තමයා නම් මොකක් හරි අමුතු වෙනසක් තියෙන කෙනෙක්.” එහෙම හිතලා කේශපුත්ත වැසියෝ තමන්ගේ ගැටළුව ඉදිරිපත් කරනවා.

**කාලාමයෝ** : අපි ආවෙ ඔබ වහන්සේ දැකලා සුව දුක් විමසලා යන්න. මොකද ඔබ වහන්සේ පිළිබඳ මෙහෙම මහා කීර්ති ඝෝෂාවක් තියෙන නිසා. හැබැයි අපි බණ අහන බලාපොරොත්තුවකින් ආවෙ නැහැ. ඒ මොකද දැන් මේ බණ අහලා, අපිට බණ අහන එක එපා වෙලා තියෙන්නේ. ඒ බණ කියන අය ඉදිරිපත් කරන එකිනෙකට පටහැනි මත හේතුවෙන්, අපිට බණ අහන්න ඕන නැහැයි කියලා හිතිලා තියෙන්නෙ. ඒවා තේරෙන්නේ නැහැ අපිට.

**බුදුපියාණෝ** : ඔබලා ගත්ත තීරණය හරියටම හරි. ඒ මොකද සැක කටයුතු දෙයක්මයි සැක කරලා තියෙන්නේ. කවුරුත් යම්කිසි දෙයක් කී පමණින්ම ඒක පිළිගන්නත් එපා. ඒක ප්‍රතික්ෂෙප කරන්නත් එපා. ඒක පිළිබඳ විමසිල්ලෙන් ඉන්න. ඒක හරි වෙන්නනත් පුළුවන් වැරදි වෙන්නත් පුළුවන්. කෙනෙක් කීව පළියටම පිළිගන්න හේතුවක් නැහැ කියලා.

**කාලාමයෝ** : ඔබ වහන්සේගේ වාදය මොකක්ද ?

**බුදුපියාණෝ** : මට වාදයක් නැහැ. මම සියළු වාද අත හැරපු කෙනෙක්. ඇත කියන අන්තයේ වාදයක් මට ඇත්තේත් නැහැ. නැත කියන අන්තයේ වාදයක් මට ඇත්තේත් නැහැ. මම වාද අත ඇරලා ඉන්නේ.

**කාලාමයෝ** : එහෙනම් ඔබ වහන්සේ මොකක්ද උගන්වන්නේ ?

**බුදුපියාණෝ** : මට වාදයක්නැහැ. මම ඕන නම් ඔයගොල්ලන් ගෙන් ප්‍රශ්නයක් අහන්නම්. එතෙකාට ඔබලට කැමති විදියට උත්තර දෙන්න. “දැන් මේ කේෂපුත්ත වැසියෝ කාලාමයෝ, ඔබලා කැමති වෙයිද, කවුරු හරි ඇවිල්ලා ඔයගොල්ලන්ව ඝාතනය කරලා නැත්තම් මරණ සමාන දුකකට තුවාල කරලා, කපලා කොටලා දමනවාට ?”

**කාලාමයෝ** : නැහැ නැහැ. අපි ඒකට කැමති වෙන්නෙ නැහැ කොහෙත්ම.

**බුදුපියාණෝ** : එහෙනම් දෙවැන්නෙක්, වෙනත් සත්ත්වයෙක් ඒ තත්ත්වයට පත් වෙන්න කැමති වෙයිද ?

**කාලාමයෝ** : නැහැ. ඒ සත්ත්තවයාටත් කැමති වෙන්න හේතුවක් නැහැනෙ. කොයි සත්ත්වයෝත් කැමති නැහැ ඒකට මුහුණු දෙන්න.

**බුදුපියාණෝ** : ආ..... එහෙනම් ඒක යුත්තක් ද ? නොකළ යුත්තක්ද ?

**කාලාමයෝ** : නැහැ ඒක නොකළ යුත්තක්.

**බුදුපියාණෝ** : ඒක සුචරිතයක්ද ? දුශ්චරිතයක් ද ?

**කාලාමයෝ** : ඒක දුශ්චරිතයක්.

**බුදුපියාණෝ** : ආ....... ඒක එහෙම තේරුම් ගත්තා නම් හොඳයි. දැන් ඒක මම කිව්වේ නැහැ. මම ඔබලාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඔබලා දෙන උත්තරයයි මේ. ඔයගොල්ලන් උත්තරයක් දෙනවා දැන්. ඒක නොකළ යුත්තක්. ඒක දුශ්චරිතයක් කියලා. ඒක හරි. එහෙම තමයි හිතන්න ඕන. දැන් තමන්ගේ ධන වස්තු, දේපල කවුරු හරි උදුරා ගන්නවා නම්, මංකොල්ල කනවා නම්, කඩා වඩා ගන්නවා නම් ඔබලා කැමතිද ?

**කාලාමයෝ** : නැහැ. අපි එහෙම කැමති වෙන්නේ නැහැ.

**බුදුපියාණෝ** : දෙවැන්නක් කැමති වෙයිද ?
**කාලාමයෝ** : නැහැ. ඒත් නැහැ.

**බුදුපියාණෝ** : එහෙනම් ඒක සුචරිතයක් ද ? දුශ්චරිතයක් ද ?

**කාලාමයෝ** : ඒක දුශ්චරිතයක් ඒ නොකළ යුත්තක්.

**බුදුපියාණෝ** : එහෙම ඒකත් හොඳයි. දැන් තමන්ගේ භාර්යාව ළඟට හෝ ස්වමි පුරුෂයා ළඟට හෝ දූ දරුවන් ළඟට වැරදි ලෙස අන් කෙනෙක් සමීප වෙනවා නම්, ඇසුරු කරනවා නම්, කාම සන්තර්පනයක යෙදෙනවා නම් ඒකට ඔබලා කැමති වෙනවාද ?
**කාලාමයෝ** : නැහැ. අපි කවුරුත් කැමති වෙන්නේ නැහැ.

**බුදුපියාණෝ** : එහෙනම් ඒ අනුව කල්පනා කරලා බලන්න අන් සත්ත්වයෝත් ඒකට කැමති වෙන්නේ නැහැ. එහෙ නම් කාමයේ වැරදි ලෙස හැරිරෙන එක සුචරිතයක්ද ?

**කාලාමයෝ** : ඒක දුශ්චරිතයක්. ඒක නොකළ යුත්තක්.

**බුදුපියාණෝ** : ආ... එහෙ නම් ඒකත් එහෙම අවබෝධ කරගන්න. යම්කිසි කෙනෙක් වැරදි තොරතුරුවලින් ඇති දේ නැති කරලා නැති දේ ඇති කරලා යම් කෙනෙක්ව වැරදි වාදයකට පත් කරනවා නම්, දෘෂ්ඨිමය වශයෙන් අවුල් ජාලයකට පටලවලා එයා දුගතිගාමී තත්ත්වයකට පත් කරනවා නම් එහෙම රැවටීමකට ලක් වෙන්න කැමතිද ?

**කාලාමයෝ** : නැහැ. අපි කැමති නැහැ එහෙම ලක් වෙන්න.

**බුදුපියාණෝ** : එහෙනම් අන්‍යයෝත් ඒකට කැමති වෙන්නේ නැහැ. ඒ නිසා ඒක නොකළ යුත්තක්. ඒක දුශ්චරිතයක්. ඒ වගේම තමයි යමකින් මත් වෙනවාද. යථාර්තය වටහා ගන්න බැරි ස්වභාවයට පත් වීම තමයි මත් වෙනවා, රත් වෙනවා කියන්නේ, ප්‍රමාදයට, ගැරහීමට දීන බවට පත්වෙනවා. එහෙම රත්වෙන, මත්වෙන තත්ත්වයට පත්වෙන එකට තමන් කැමතිද ?

**කාලාමයෝ** : නැහැ. එහෙම වෙනවානම් අපිට යථාර්තය දැක ගන්න බැරුව යනවා නේ.

**බුදුපියාණෝ** : එහෙනම් ඒකත් හොඳ නැහැ. ඒ වගේම අනුන්ත් ඒකට කැමති නැහැ. ඒ නිසාමත් වෙන්නවත් මත් කර වන්නවත් නුසුදුසුයි.

**බුදුහාමුදුරුවෝ කිව්වා. "ඔන්න ඕන තමයි යමක් අවබෝධයෙන් තේරුම් ගන්නවා කියලා කියන්නේ. ඥාණය මෙ හෙයවලා තේරුම් ගන්නවා කියන්නෙ" කියලා. එතකොට යම්කිසි කෙනෙක් ඔන්න ඕකයි ඉස්සෙල්ලාම ඉගෙන ගන්න ඕන.**

මතු සම්බන්ධයි